සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

71 S I

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
## Third Term Test - Grade 12 - 2024

# සිංහල - I

කාලය පැය 03 යි
අමතර කාලය වි. 10යි

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

---

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

---

(01) පහත දැක්වෙන (අ) , (ආ) , (ඉ) , (ඊ) සහ (උ) උද්ධෘත අතුරින් සතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න.)

(අ) ඒ කුමාරයන් සොළොස් හැවිරිදි අවස්ථාවෙහි පාණ්ඩුරෝග ඇති විය. එක් දවසක් කුමරුන්ගේ මෑණියෝ බමුණාණන්ට වස්තු ලෝභයෙන් ඊ අවස්ථාවක් නැතත් තුමූ පුතණුවන්ගේ සැටිය දැක බමුණාණන් බණවාලා 'තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර. උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේ ය. ඊට නිසි පිළියම් දන්නා කෙනෙකුන් ගෙනවුත් පිළියමක් කරව'යි උන්ගේ අදහස් ආහරණය කළ ලෙසින් ම නොහැඟුණා සේ කිවූය. බමුණාණෝ ඒ අසා 'පින්වත් බැමිණි කුමක් කියයි ද? පිළියමට වෙදවරුන් ගෙනා කල වෙදකම නිමන තෙක් බතුත් දුන මැනව. මංකුලීත් දුන මැනව. කෙළවර මිලත් දුන මැනව. බලවත්ව තිබෙන ව්‍යාධි හෙයින් මිලත් මදකින් සෑහී නොයෙයි.

(i) බැමිණිය බමුණාගෙන් කළ ඉල්ලීම කුමක් ද?

(ii) වෛද්‍ය වරයාට සුළු මුදලක් දීම ප්‍රමාණවත් නොවන්නේ ඇයි ?

(iii) ''මං කුලීත් දුන මැනව'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ''අවස්ථාවක්'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ආ) ''පළමුව පලාගොස් කුඹුරෙහි වන අත් ගසා ඇළමං පායාපායා ගෙන දෙවනුව ශුභ වූ නකතකින් ගෙවඩා බිම් නගා දෙසී තුන් සී සා මියර කපා කැට තළා පෝරු ගා බිජුවට වඩා විධි වූ පරිද්දෙන් කුඹුරෙහි වපුටගත මැනව. ඒ වපුළා වූ කුඹුරෙහි සතා සතුන් සතියක් රැක්ක මැනව. වැට බැඳ ඉස්නන් නමා එ ගොයම් තිලන අවස්ථාවෙහි කුඹුර මැද රකවල් පැලක් තබාගෙන මැසි දඩක් ලාගෙන ගෙයි දී කන බතෙක රස නොදැන ඇඳෙක පිටක් නොතබා රාත්‍රී භාගයෙහි එක දවසෙකත් නින්දේ නින්දක් නිඳා නොපියා ගෙරින් මීවුන් ඌරන් මුවන් ආදී වූ සතා සතුන් සාර මසක් රැක්ක මැනව. කරලක් නැඟූ තෙන පටන්ගෙන පියන්වා ආදී වූ නොයෙක් රෝගයට කෙම්පාන් කමසේ නැතිව කළ මැනව.''

(i) ගොවියෙකු අවකාශයක් නොමැතිව කළයුතු කාර්ය කුමක් ද?

(ii) කුඹුර මධ්‍යයෙහි රකවල් පැලක් සාදා ගත යුතු අවස්ථාව කුමක් ද?

(iii) ''ශුභ වූ නැකතකින් ගෙවඩා බිම් නගා'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ''ඉස්නන් නමා'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ඉ) ක්ෂත්‍රිය කන්‍යාවන් හැම දෙන ම කසාය වස්ත්‍ර ගෙන හැඳ පෙරව අව මැනව යි විධාන කළහ. උයිත් එලෙසින් ම අවුත් පිරිවරා සිටියා හ. බුදුහු වැඩ වදාරා පනවන ලද ආසන මස්තකයෙහි පලක් බැඳ වැඩ උන් සේක. ඉක්බිති හැම දෙන ම එක පැහැර බුදුන් පාමුල්හි අඩා හුන්හ. බිම්බා දේවීන් වහන්සේ ද බුදුන්ගේ ශ්‍රී පාදයෙහි ජංඝාපරියන්තය තරයේ අල්වා හඬා වැලප සෝක සන්සිඳුවා මයිල් රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි මහත් වූ ආදර බහුමානයෙන් එකත්පසෙක උන් සේක. ''ස්වාමීනි, මාගේ යෙහෙළි තොම නුඹ මහබිනික්මන් කොට කසාය වස්ත්‍රයක් පෙරවීය යනු අසා තුමූ අංගරාග නොගැල් වූ විරූය.''

(i) ක්ෂත්‍රිය කාන්තාවන් ලද විධානය කුමක් ද?

(ii) මයිල් රජ්ජුරුවන් වහන්සේ යනුවෙන් හැඳින්වෙන්නේ කවුරුන් ද?

(iii) ''ශ්‍රී පාදයෙහි ජංඝා පරියන්තය තරයේ අල්වා'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ''අංගරාග'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ඊ) එකල්හි ඒ චණ්ඩාල බ්‍රාහ්මණයා ''එසේය දේවයන් වහන්ස, මාගේ ස්වර්ණතිලකා නම් වූ දූ තොමෝ ජාති සම්පන්න ව කුල පුත්‍රයන් මිස සෙස්සවුන් නොකැමැත්තීයැ'යි කීය. එබස් අසා රජ්ජුරුවෝ ''එම්බල සගය, එසේ වී නම් පඤ්ච මධුරා නම් නුවර උද්දාල නම් බමුණෙක් වෙසෙයි. ඒ බ්‍රාහ්මණයා ඉතා ජාති සම්පන්න ය; මව් පියන් දෙපක්ෂයෙන් ම අනින්දිත ය; ස්ත්‍රීන් දුටු කල්හි ''ජුගුප්සා කටයුතු වූ ඉතා පිළිකුල් ජාතියෙකැයි නින්දා බැණ ඔවුන් හා සහවාසය නොකෙරෙයි. තමා වසන ගෙන් නික්ම රජගෙට යන එන වේලෙහි කිරි පැන් සොළොස් කළයක් මඟදිග ඉස්වයි. ගැහැණුන් දුටු කල කාලකණ්ණියක දැකපීමි,යි කිරිපැණින් මුහුණ ශුද්ධ කෙරෙයි.

(i) ස්වර්ණතිලකාගේ වරදක් ලෙස පෙන්වා දෙන්නේ කුමක් ද?

(ii) උද්දාල බ්‍රාහ්මණයාගේ චරිත ලක්ෂණ 02 ක් දක්වන්න.

(iii) ''දෙපක්ෂයෙන් ම අනින්දිතය'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) ''සොළොස් කළයක්'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(උ) කෙළිමින් තැන තැන ළන්දූ
දෙනමෙන් කන අම බින්දූ
කියමින් සොඳ ගී සින්දූ
ඇසුවන් සිත දුක් සින්දූ

පුරවා තුරු රැවින් අහස
කරවා ගී නැටුම් වෙසෙස
අරවා සත සිත දොම්නස
පුරවාසී කෙළිති මෙලෙස

(i) පුර කාන්තාවන් ගයන ගීතවල මිහිරියාව කෙබඳු ද?

(ii) ආකාශය පිරීයන්නේ කුමකින් ද?

(iii) ''කරවා ගී නැටුම් වෙසෙස'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ''අරවා'' යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- **(උ) සහ (ඌ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.**

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) ''මට මේ සා මහත් හානියක් කළ තැනැත්තවුට මේ විතරෙක් මඳ''

(ii) ''යහළු, ජරාමරණ දෙදෙනාගේ පසු පළමු වීමෙහි විභාගයෙක් නැත.''

(iii) ''වැළි තිට රජ කුලෙහි සම්පත්තීන් ප්‍රයෝජන කිම් දැ''

(iv) ''මෙබඳු ස්ත්‍රී රත්නයකින් වියෝ ව ජීවත් වීමට වඩා මිය යාම යහපත.''

(v) ''ඩිංගිරිගෙන් බත් ඉල්ලගෙන කාලා නිඳාගන්න.''

(vi) ''උඹ අදට ගෙනියන හතරවෙනි දිය හට්ටිය නේ ද මේ ?''

(vii) ''අස්වැසී සිටිනු මැන - ගුරුදේවයිනි අපගේ''

(ඌ) වස්තු විෂය හා බස් වහරෙහි ඔබ දකින විශේෂතා පැහැදිලි කරමින් පහත දැක්වෙන නිර්මාණයෙහි සාහිත්‍යමය අගය විමසන්න.

මීසුණු කුසුම් රොන් මුසු නල සුව දැනවී
මේදුනු රැගෙන එයි මා අබියස මලවී
වාවනු නොහැක නැතිව ද ගී හඬ කුරවී
පායනු මැනවි! අඩ සඳ, පායනු මැනවී

පිඩු කළ අමා තරුණියකගෙ අදර යුගෙන්
අඩු වැඩි නොකර ගත හැකි බව උගෙන මගෙන්
පඩු පැහැ මවා රන් මුසු කර වැඩිව අගෙන්
උඩු තොල ඇයගෙ පිළිරුවකට රැගෙන නැගෙන්

පටු නළලකට දළැසිඟු ඉසි කරන නිසා
ගොටුවක අමා බහමින් වෙල වියන වසා
තුටු කර ඔහුව අප වැනි අය ගැන ම අසා
බටු වැනි ඔබත් ලොව පැවතුණ අඳුර නසා

සව සට මුවරදද සහ විත් කිරණ ගලා
සුව දුක් අසා තරුණියකගෙ මුහුණ බලා
මව පත්! නළල ඉන් පසු යන අතර කලා
මුව ඇගෙ මවන හැටි එයි හුරු පුරුදු වෙලා

මගේ සුන්දරිය කන අබරණ ඉහත තැනූ
පිළි ගත් නෙ වත් නැත වෛහෙයින් තරග වෙනූ
සුර ඹුන් කනට කොයි කවදත් ලකර වුණු
ගන රන් තෝඩුවක හැඩහුරු කමට එනූ

පුන් පියයුරට තරගයකැයි සිතට දැනී
සුන් දර සුරඹ පෙති පෙති කැපු වියරු ගැනී
රන් තැඹිලියක ඇස්සක් නුබ පතිත විණී
ඉන් ඔබ මැවුණු බව කවියා හොඳට දනී

රූමති යන්ගෙ මුව තඹරට පැරද යතී
දැකැති හදමු කපනට සර වනය නිතී
මේගති යකින් සුරඹුවො සුර ලොවෙහි ඇතී
පාදති ඔබව හැඩහුරුකම ගැන ද සිතී

රටත් වදුලුවල තුරු කොළ විජිනි පතින්
මීකත් තොමෝ මඳ නල දී ඔබගෙ ගතින්
ආයෙත් ගිමන් නිවමින් ඇති හෙයිනි ඉතින්
බීමත් වන්න! කුමුදක රස කිරණ විතින්

(ලකුණු 12)

(02) රස විඳීමට කතාවක් සහ ආගමික වශයෙන් උපදේශයක් ඉදිරිපත් කිරීම සද්ධර්මරත්නාවලී කතුවරයාගේ අභිප්‍රාය විය. නිර්දිෂ්ට කතා වස්තුවක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15)

**නැතහොත්**

සමාජය යහමඟට ගැනීමේ අරමුණු ප්‍රධාන කරගත් කතා රසකින් මිනිස් සිත විවරණය කිරීම ජාතකකතාකරුවාගේ පරමාර්ථය වූ බව ඔබට නියමිත කථා වස්තුවක් ඇසුරෙන් සනිදර්ශිතව පැහැදිලි කරන්න. (ලකුණු 15)

(03) පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් තවත් එක් ප්‍රශ්නයක් ද තෝරා ගෙන පිළිතුරු සපයන්න.

(අ) දඹදෙණිය සහ ගම්පොළ සාහිත්‍ය යුගවල රචිත ගද්‍ය නිර්මාණ අතුරෙන් දෙකක් පිළිබඳ ව විවරණයක් කරන්න. (ලකුණු 07)

(ආ) සද්ධර්මාලංකාර කතුවරයා ලෞකික සැප කෙරෙහි පමණ ඉක්මවා ඇලුම් කිරීමේ ආදීනව කතා රසය මතුවන ආකාරයෙන් ඉදිරිපත් කරන අයුරු ස්වර්ණතිලකා වස්තුව ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

පූජාවලි කතුවරයා රසවත් කතාවක් ඉදිරිපත් කළ ද කතා තේමාව සර්වකාලීන අගයකින් යුක්ත ය. අනුරුද්ධ කුමාර කථාව ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(04) ගුත්තිලයේ එන බරණැස් රජ වැනුම වෑත්තෑවේ හිමියන් සාම්ප්‍රදායික කවිමග අනුව යමින් අතිශයෝක්තියෙන් යුතු ව වර්ණනා කර ඇත. විමසන්න. (ලකුණු 15)

(05) සිංහල නවකතාවේ ප්‍රභවයට හා විකාශනයට බලපෑ කාලීන සමාජ පසුබිම සහේතුවකව පැහැදිලි කරන්න. (ලකුණු 15)

(06) කෙටිකතා ලක්ෂණ තුනක් පැහැදිලි කොට නිර්දිෂ්ට කෙටිකතාවක් ඇසුරෙන් විභාග කරන්න. (ලකුණු 15)

(07) කොළඹ යුගයේ ද්වීතීය තරංගයේ කවීහු කාව්‍ය රචනයේ දී විවිධ අනුභූතීන් යොදා ගත්ත ද එය සොබා දහම ඇසුරෙන් විවරණය කළහ. නියමිත පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 15)

(08) සරච්චන්ද්‍රයන් සිය නාට්‍ය සඳහා මූලාශ්‍ර වශයෙන් සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ යොදා ගත්ත ද කතුවරයාට අභිමත පරිදි එය වෙනස් කර ගැනීමට සමත් වූ බව ''පෙමතෝ ජායතී සෝකෝ''නාට්‍යයේ ප්‍රථම අංකය ඇසුරින් විමසීමට ලක් කරන්න. (ලකුණු 15)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved


වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

71 S II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 12 - 2024

# සිංහල - II

කාලය පැය 03 යි
අමතර කාලය වි. 10යි

- I කොටසේ පළමුවන ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

## I කොටස

- එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

(01) (1.1) වීර්ය යන වචනයේ ඇතුළත් ව්‍යංජන අක්ෂර නිවැරැදි ව වර්ග කර ඇති වරණය තෝරන්න.
(1) මූර්ධජ හා දන්තජ
(2) අන්තඃස්ථ
(3) අඝෝෂ
(4) අල්පප්‍රාණ
(5) තාලුජ හා මූර්ධජ (..........)

(1.2) අකාරාදී පිළිවෙළ අනුව නිවැරැදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) උකුවෙල, පොල්ගොල්ල, කොත්මලේ, රත්කිඳ
(2) උකුවෙල, රත්කිඳ, කොත්මලේ, පොල්ගොල්ල
(3) කොත්මලේ, උකුවෙල, රත්කිඳ, පොල්ගොල්ල
(4) උකුවෙල, පොල්ගොල්ල, රත්කිඳ, කොත්මලේ
(5) උකුවෙල, කොත්මලේ, පොල්ගොල්ල, රත්කිඳ (..........)

(1.3) අක්ෂර වින්‍යාසය නිවැරැදි ලෙස යෙදී ඇති වරණය තෝරන්න.
(1) මොණරා, කැළණිය, සමස්ථ, නීත්‍යානුකූල
(2) මොනරා, කැලණිය, සමස්ථ,නීත්‍යානුකූල
(3) මොනරා, කැලණිය, සමස්ත, නීත්‍යනුකූල
(4) මොණරා, කැළණිය, සමස්ත, නීත්‍යානුකූල
(5) මොනරා, කැලණිය, සමස්ථ, නීත්‍යානුකූල (..........)

(1.4) පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරැදි ප්‍රකාශය තෝරන්න.
(1) ශුද්ධ සිංහල හෝඩියේ අක්ෂර ගණන තිහකි.
(2) රේඵය හා රකාරාංශය ර් අක්ෂරය වෙනුවට යෙදෙන සංකේත දෙකකි.
(3) සිදත් සඟරා හෝඩියට ඇ කාරය ද ඇතුළත් ය.
(4) මිශ්‍ර සිංහල හෝඩියේ අක්ෂර ගණන හැටකි.
(5) සියලු ම ස්වර අඝෝෂ ගණයට අයත් වේ. (..........)

(1.5) එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) විහාර දොරටුව, නගර වැසියා, සුන්දර ජීවිතය, ධර්ම කතා
(2) සසර චාරිකා, වසර අවසාන, බමර නාදය, ස්වප්න ලොව
(3) දහම් දෙසුම, පළමු වසර, නිහඬ සිතිවිලි, ඇදුරු ඔවදන්
(4) චන්ද්‍ර රශ්මි, ප්‍රධාන ලිපිය, බ්‍රාහ්මණ දහම, දේව පිරිස
(5) තරුණ අඟන, මාර්ග සලකුණු, නිවන් මාර්ගය, ලෝක සිරිත් (..........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(1.6) තත්සම වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) මාර්ග, නාග, පාලක, ඉන්දීවර

(2) ගාමිණී, ජාති, විදේශ, නිකෙලෙස්

(3) කෝකිල, මාස, නිවන්, මරණ

(4) ජාල, මණ්ඩුක, නද, තේජ

(5) මනස්තාප, සසල, ආසන්න, ගිරි (..........)

(1.7) තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) වකුටු, බෙහෙත්, පැවිදි, දේවාල

(2) උත්පල, නෙත්, පොත්, වස්තු

(3) අංකුර, දිසි, වැසි, නිසි

(4) මෙත්, කෙත්, බොදු, රුදු

(5) නගර, අඟර, පළමු, සරණ (..........)

(1.8) විශේෂණ, විභක්ති, අන්‍යාර්ථ, අව්‍යය යන වර්ගවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ලියකොමල, නොමිනිස්, බටහිර, යගුලිය

(2) ලියකොමල, යගුලිය, නොමිනිස්, බටහිර

(3) ලියකොමල, බටහිර, යගුලිය, නොමිනිස්

(4) යගුලිය, බටහිර, ලියකොමල, නොමිනිස්

(5) ලියකොමල, යගුලිය, බටහිර, නොමිනිස් (..........)

(1.9) කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නටන, සරන, මරන, දරන

(2) මැරුණු, ඉරුණු, එරුණු, දරුණු

(3) කැපෙන, බේරෙන, පෑරෙන, පෑහෙන

(4) පැනිලි, ගැහිලි, බේරිලි, කෙඳිරිලි

(5) කපනය, දක්නය, මකනය, මරණය (..........)

(1.10) තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නාගරික, ව්‍යාපාරික, වාර්ෂික, නෛතික

(2) වරලස, සිසිලස, ලවනත, කොපුලත

(3) සිල්වත්, පෙම්වත්, අදවත්, තෙදවත්

(4) බමුණාණ, බෑණ, දියණි, පුතණු

(5) ගැමි, රැටි, දැති, ඇඳිරි (..........)

(1.11) පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) **<u>නොයන්</u>** පුතුනි, ගම හැර දා (ආ) උඩ **<u>පැන පැන</u>** හිනැහුණා

(ඉ) **<u>සිඳිත</u>** මඬිත එක ලෙස පැතිරෙයි සුවඳ (ඊ) තබන තබන පය ලිස්සා **<u>වැටීයන්</u>**

(1) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

(2) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා

(3) ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා

(4) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, ආශිර්වාද ක්‍රියා

(5) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා (..........)

(1.12) උපසර්ගයක් යෙදී නොමැති පදයක් ඇති වරණය තෝරන්න.

(1) නිසල, නිහඬ, නිමල, විමල
(2) ඔවදන්, අවවාද, අවපැහැ, අනුගත
(3) අදිරද, සුසිනිඳු, සුදසුන්, උහිස්
(4) අබිමන්, සංකල්ප, පරිවර්තන, ඉමිහිරි
(5) පිළිසරණ, පබඳ, පවර, පසැස් (..........)

(1.13) නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ඉඳුරා, පවා, දැන්, එයා
(2) අපොයි, අයියෝ, අහා, අඳෝ
(3) නො, එපා, ඔව්, සේක
(4) මෙන්න, කෙරෙන්, විසින්, ඉතින්
(5) ඒයි, හෝ, කෝ, සා (..........)

(1.14) ''**මිහිකත සඳනලෙව් දුන්** උර මඬල වැනි'' යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සමාස, සන්ධි, කෘදන්ත
(2) විභක්ති, නිපාත, ක්‍රියා
(3) සමාස, විභක්ති, ක්‍රියා
(4) විභක්ති, සන්ධි, ක්‍රියා
(5) සමාස, සන්ධි, ක්‍රියා (..........)

(1.15) සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) වැටිණ, පෙනිණ, පැමිණ, දැනිණ
(2) බලා, කියා, ගයා, ගොස්
(3) ඇසේ, පෙනේ, දැනේ, ගියේ
(4) දනී, පනී, ගනී, වුණී
(5) නළවති, රවති, නියවති, මරවති (..........)

(1.16) සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මී පැණි, පොල්තෙල්, වනමල්, සල්මල්
(2) වස්දොස්, දුන්වත්, රත්නෙත්, පොත්පත්
(3) නිහඬ, උපැස්, අපල, අනවබෝධ
(4) කුදිටු, කුසීත, සුමිහිරි, අපවාද
(5) මිහිලිය, පෙම්මල්, බිම්මල්, ගී කවි (..........)

(1.17) එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) නරනිඳු, මුනිඳු, මිගිඳු, තරිඳු
(2) උරුමක්කරු, කරුමක්කරු, දඩයක්කරු, නුවණක්කරු
(3) කටුවල, තුනුවඟ, ගෙවුයන්, දෙවුර
(4) වැල්ලම්පිටිය, ඉදල්ලිරිගු, අල්ල, පොල්ලත්ත
(5) යටැසින්, වමැසින්, බැලුමැසින්, වපරැසින් (..........)

(1.18) ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය තෝරන්න.

(1) විදුරවි, මලවි, පන්හිඳ, නිසයුරු
(2) වැව්ලි, තැව්ලි, පෙව්ලි, තේරව්ලි
(3) බල බල, කඩ කඩ, පිස පිස, නටමින්
(4) එපා, ඉතින්, අනේ, දැන්
(5) රූමත්, බුද්ධිමත්, වල්මත්, ඉසුරුමත් (..........)

(1.19) ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය තෝරන්න.

(1) මම හොඳ දරුවෙකි.
(2) ඇතැමෙක් ගී කියයි.
(3) සිරකරුවන් ද මනුෂ්‍යයන් ය.
(4) කොවුලන් විසින් ගී ගැයෙති.
(5) ඔවුන් මට සිහිනෙන් පෙනේ (..........)

(1.20) ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

(1) මොකක් ද මේ ?
(2) සිල්ප සත්වෙනි දවස දක්වමි.
(3) අද ගෙදර යනවා ද?
(4) මගේ යාළුවෝ හොඳින් නේ ද?
(5) මේ තව තියෙන්නේ. බලන්නකෝ අනේ. (..........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

- මෙම කොටසින් 02, 03 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න සතරකට පිළිතුරු සපයන්න.

(02) (අ) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ළමා සාහිත්‍යයේ අරමුණ විය යුත්තේ සාහිත්‍ය කටයුතු අනුසාරයෙන් නිරවද්‍ය චින්තනයෙන් ප්‍රභාවිත විවිධ විෂයයන් හා විපුල ක්‍රමයන් පිළිබඳ සාරගර්භ ශික්ෂණයක් නිර්මාණ ක්‍රියාවේගයන් ජනනය කෙරෙන ශික්ෂණයක් කරා බාල පරපුර මෙහෙයවීමයි. අස්වාභාවික නොවන සේ රචිත විධිමත් ළමා සාහිත්‍ය කෘති මගින් ළමා මනස මිථ්‍යා විශ්වාස හා කල්පිත ලෝක කරා ඇදී යාම වළක්වාලීමට සැලකිය යුතු පිටුබලයක් සැපයෙයි. මූලික වශයෙන් වර්ග දෙකකට බෙදෙන ළමා සාහිත්‍ය කෘතිවලින් එක් වර්ගයක් සෞන්දර්යාවබෝධය හා වින්දනය ලබා දීමේ කරණීය ආකල්ප තහවුරු කරයි. අනෙක් වර්ගය ළමයා අවට ලෝකයේ පවතින විවිධ ධර්මතා පිළිබඳ අවබෝධය ලබා දෙයි.

ළමා ලෝකයේ පවතින රසවත් සංකල්පනා පදනම් කර ගැනුණු රචනා කියවීමට ළමයින් තුළ පවතින්නේ බලවත් ආශාවකි. ජනකතා, ජන ගී, ජන කාව්‍ය ආදී ජනශ්‍රැති අංග කෙරෙහි ද ස්වකීය ආගමික සිතුම් පැතුම් හා ප්‍රතිඥාවන් වස්තු බීජ කර ගත් සරල නිර්මාණ කෘති කෙරෙහි ද ළමා රුචිය ඉස්මතු වෙයි. ස්වභාවධර්මයේ විවිධාංග, විද්‍යාංශ, ඓතිහාසික වෘත්තාන්ත හා තත්කාලීන සිදුවීම් යනාදී විෂයයන් පිළිබඳ ව ළමා මනස මෙහෙයවීමට සූක්ෂම ලෙස නිර්මාණය කෙරෙන කෘති යොදා ගත හැකි ය. දියුණු ළමා සාහිත්‍යයක් පවතින රටවල ස්වභාව විද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ මූල දැනුමක් ලබා දෙමින් රචිත පොත්වලට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. එම කෘති මගින් ළමයින්ගේ චින්තන ශක්තිය පුළුල් වේ. ස්වභාවධර්මය පිළිබඳ විමසිල්ලෙන් පරීක්ෂා කොට එය අභිභවා ක්‍රියා කිරීමේ හැකියාව වර්ධනය වේ. ලෝකයේ සෑම රටක ම වෙසෙන ළමයින් සාමාන්‍යයෙන් ඒකාකාර වුව ද ඔවුන් සඳහා ලියැවෙන කෘති රටින් රටට වෙනස් වේ. එසේ වෙනස් වන්නේ විවිධ චර්යාවන් හා ඒවායේ ප්‍රතිඵලවලින් ගොඩනැඟී ඇති පුරුෂාර්ථ ගැබ්කොට ගත් සංස්කෘතික රටාවේ බලපෑම නිසා ය. මේ අනුව විමසිලිමත් වන විට බටහිර රටවල ළමා සාහිත්‍ය කෘතිවලට වඩා ලංකාවේ ළමයින්ට ආසියාතික රටවල නිර්මාණය වූ කෘති ප්‍රියජනක වන බව පෙනේ.

ළමා සාහිත්‍ය කෘතීන්හි භාෂාව කෙරෙහි ද අපගේ අවධානය විශේෂයෙන් යොමු විය යුතු වේ. ළමයින් කතා කරන භාෂාව ග්‍රන්ථ භාෂාවට වඩා ප්‍රාණවත් ය. මුල් අවධියේ ළමයින් සඳහා ලියැවෙන පොත් ළමා ව්‍යවහාරානුසාරී වූ ද මානසික පරිසරයට අනුකූල වූ ද භාෂා ස්වරූපයෙන් යුක්ත විය යුතු ය.

(i) ළමා මනස මිථ්‍යා විශ්වාස හා කල්පිත ලෝක කරා ඇදී යාම වැළැක්වීමට උපකාරී වන්නේ කවර වර්ගයේ කෘති ද?

(ii) මේ ඡේදයේ දැක්වෙන ජනශ්‍රැති අංග මොනවා ද?

(iii) ළමා මනස මෙහෙයවීමට සූක්ෂම ලෙස නිර්මාණය කෙරෙන කෘති සඳහා යොදා ගත හැකි විෂයයන් දෙකක් නම් කරන්න.

(iv) දියුණු ළමා සාහිත්‍යයක් පවතින රටවල විශේෂ අවධානයක් යොමු වන්නේ කවර වර්ගයේ කෘති කෙරෙහි ද?

(v) මුල් අවධියේ ළමයින් සඳහා ලියැවෙන කෘතිවල භාෂා ස්වරූපය කෙබඳු විය යුතු ද?

(vi) ළමා සාහිත්‍ය කෘති මූලික වශයෙන් වර්ග කීයකට බෙදේ ද? එයින් එකක් ලියන්න.

(ලකුණු 2 x 6 = 12)

iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

(ආ) පහත දැක්වෙන උද්ධෘතය එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

''වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවලට කිසිම නෑ සබඳකමක් නැති අපූරුවක් නොව ක්‍රමයෙන් වෙනස් වීමෙන් අලුත් ස්වරූපයක් ගත් පැරණි කෙටිකතාවමයි.'' යනු මාර්ටින් වික්‍රමසිංහගේ කියුමකි. ඔහු මේ මතය පවසන්නේ වර්තමාන සිංහල කෙටිකතාව අමාවතුර, බුත්සරණ, සද්ධර්මරත්නාවලීය, සිංහල ජාතක පොත යනා දී අපේ චිරන්තන සාහිත්‍ය ග්‍රන්ථයන් හි එන කථාවස්තු හා සම්බන්ධ කරමිනි. වික්‍රමසිංහ විශේෂයෙන් ම සිංහල ජාතික කථාත් වර්තමාන කෙටිකතාත් අතර බොහෝ සමාන ලක්ෂණ දකින්නේ වස්තු විෂය, යථාර්ථ රීතිය යන අංශවලිනි. වර්තමාන කෙටිකතා ජතක කථාවලින් වෙනස් වන්නේ වස්තු විකාසනය අතින් බව ඔහු පෙන්වා දී ඇත්තේ ය.

චිරන්තන සිංහල සාහිත්‍ය ග්‍රන්ථයන් හි එන කථාවස්තු හැරුණු විට චරිත කථා, ඉතිහාස කථා, දේව කථා, මහදැනමුත්තාගේ කථා ආදී ජන කතාන්දර, කවි කොළ යනාදී වශයෙන් කථා ප්‍රවෘත්ති කියැවෙන ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග රාශියක් අපට ඇත.

ප්‍රමාණය අනුව සලකන කල කෙටි වූ කතාවේ ඉතිහාසය බොහෝ ඈතට දිවෙන නමුත් නවකතාව, කෙටිකතාව යන නම් ඇති ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත නව සාහිත්‍යාංග දෙක සිංහලයට පුරුදු වූයේ බටහිර සාහිත්‍යයේ ආභාසය ඇති ව බව කිව මනා ය. මෙරට ඉංග්‍රීසි ආධිපත්‍යයට යටත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ලියැවුණු සාහිත්‍යය මෙහි පැතිරී යාමත් සමඟ ම ඒ සාහිත්‍යය ආදර්ශයට ගෙන ඉන් ආභාසය ලබමින් සිංහල සාහිත්‍ය පෝෂණය කිරීමට ගත් එක් උත්සාහයක එක් ප්‍රතිඵලයකි මෙරට වර්තමාන කෙටිකතාව ආරම්භ වීම. එසේ ම සිංහල පුවත්පත් සඟරා ද කෙටිකතාවේ දියුණුවට මහත් රුකුලක් වූයේ ය.

(ලකුණු 13)

(03) දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) ලෝක බලවතුන්ගේ යුද ගැටුම් හේතුවෙන් අභියෝගයට ලක් වන දිළිඳු රටවල ශ්‍රම වෙළඳපොළ

(ii) ළමා චරිත සංවර්ධනයෙහි ලා ජනකතාවලින් සැපයෙන පිටිවහල.

(iii) මාර්ගගත අධ්‍යාපනය (Online) මෙරට පාසල් ශිෂ්‍ය ප්‍රජාවට සිදුකළ බලපෑම.

(iv) මානව ක්‍රියාකාරකම් හේතුවෙන් දිනෙන් දින බිඳ වැටෙන පාරිසරික සමතුලිත බව.

(v) බෝ නොවන රෝග අවම කර ගැනීම සඳහා ක්‍රීඩාවේ අවශ්‍යතාව.

(ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) ඔවුහු බොහෝ දෙනෙක් එම රැස්වීමට සහභාගීවූවන් වෙති.

(ii) රටේ උන්නතිය උදෙසා කාන්තාවෝ පෙරට ආ යුතුය.

(iii) අපේක්ෂකයන් මැතිවරණය ගැන දක්වන අදහස් මොනවා ද?

(iv) ජයග්‍රාහකයින් ජය සමරද්දී පරාජිතයෝ නිහඬ ව බලා සිටියහ.

(v) ඔහු ද මම ද නුඹ ද විදේශ රැකියාවකට පිටත් වෙහු.

(ලකුණු 1 x 5 = 05)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ගුරුවරු පාසලේ දක්ෂතම ශිෂ්‍යා ලෙස මා තෝරා ගත්හ.

(ii) ගොවියෝ මී හරකුන් ලවා කුඹුරු සාවති.

(iii) රජය රුසියාවේ ශ්‍රී ලංකා තානාපති ලෙස කාන්තාවක පත් කළේ ය.

(iv) පොලීසිය නිළියක හා නළුවකු අත්අඩංගුවට ගනියි.

(v) පුරාවිද්‍යාඥයෝ වටිනා පුරා වස්තූන් රැසක් සොයා ගත්හ.

(ලකුණු 1 x 5 = 05)

(ඉ) නිවැරැදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) සැකකරුවන්ගේ එක් (අයෙක් / අයකු) සිර මැදිරියෙන් පලා (යති. / යයි.)

(ii) (මිනිස්සු / මිනිසුන්) අතුරෙන් කිහිප (දෙනෙක් / දෙනෙකු) ගමනට සහභාගී වූ හ.

(iii) (මම / මා) සංචාරයට සහභාගී (වෙති'යි / වෙමි'යි) ඇතැම්මු නොසිතූහ.

(iv) (කම්මැලියෙක් / කම්මැලියකු) මෙන් වැඩ නොකරන ලෙස ගුරුතුමා ඔහුට අවවාද (කළෝය / කළේය)

(v) (අපි / අප) පරාර්ථ චරියාවට කැප විය (යුත්තෙමු. / යුතු ය.)

(ලකුණු 1 x 5 = 05)

(05) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **ලෝකවාසී බෞද්ධයෝ සම්බුද්ධත්ව** ජයන්තිය සැමරූහ.
(ලෝකවාසී - සමාස, බෞද්ධයෝ - විභක්ති, සම්බුද්ධත්ව - තද්ධිත)

(ii) ජල **ගැලීම් නිසා** විපතට **පත්වූවන්ට** සහන සැලසේ.
(ගැලීම් - කෘදන්ත, නිසා - නිපාත, පත්වූවන්ට - විභක්ති)

(iii) **සුරඟනන්** බඳු වරඟනන් **දුටු** දනෝ විස්මිත ව **බලා** උන්හ.
(සුරඟනන් - සන්ධි, දුටු - කෘදන්ත, බලා - ක්‍රියා)

(iv) ශ්‍රී ලංකා කණ්ඩායම හමුවේ **ප්‍රබල ඉන්දියානුවෝ පරාජයට** පත් වූහ.
(ප්‍රබල - උපසර්ග, ඉන්දියානුවෝ - තද්ධිත, පරාජයට - උපසර්ග)

(v) **ආගමික** වතාවත්වල යෙදුණු **උවසුඋවැසියෝ භාවනානුයෝගී** ව කල්ගත කළහ.
(ආගමික - තද්ධිත, උවසුඋවැසියෝ - සමාස, භාවනානුයෝගී - සන්ධි)

(ලකුණු 3 x 5 = 15)

(06) (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) ................................................. පරාක්‍රම බාහු රජ සමය සාහිත්‍ය උන්නතියට පිටුබලයක් විය.

(ii) වත්මන් ................................................. පරපුර දේශපාලනයට සම්බන්ධ වීම අනුමත කළ හැකි ද?

(iii) විශාඛාවෝ බෝ ................................................. ඇමඳ, මලස්න පිරිසිදු කොට මල් පිදූවෝය.

(iv) ඔහු ................................................. පෙළ ඉහළ සාමර්ථ්‍යයක් සහිත ව උපාධිය සමත් විය.

(v) මහවැලි ගඟ අසබඩ පිහිටි සීමා ................................................. උපසම්පදා කර්මය සඳහා යොදා ගැනේ.

(vi) ධර්මකීර්ති ................................................. පරම්පරාව මහනුවර අවධිය තෙක් ම දක්නට ලැබෙයි.

(දෙවන, මාලකය, ද්විතීය, සංඝ, මළුව, සඟ) (ලකුණු ½ x 6 = 03)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) දෙ+ අත (ii) රස + ආස්වාද (iii) පත් + ඉරු

(iv) අදර + ඇති (v) උපන් + උපන් (iv) සුරු + අත

(ලකුණු ½ x 6 = 03)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **වියත්හු දුහුනන්ට** නොමසුරු ව දැනුම ලබා දෙති.

(ii) **පින්වතුනි, පඩිපෙළින්** බැස අයින් වී එන්න.

(iii) මම **යහළුවන්** සමඟ **පයින්** ගමන් කළෙමි.

(ලකුණු ½ x 6 = 03)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

තරගය ජයගත් ක්‍රීඩකයෝ අපි දිනුවා යි පවසමින් ජය පැන් බොති අත්පොළසන් දෙති ඔල්වරසන් හඬ නඟති සැබවින් ම එය ආස්වාදජනක අත්දැකීමක් නොවේ ද

(ලකුණු ½ x 6 = 03)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) ''දරුවනි, අලුත් මල් පොකුරු රැගෙන එන්න''යි විදුහල්පතිතුමා සිසුන්ට පැවසී ය.

(ii) ''මාගේ මේ ව්‍යායාමය හුදෙක් රජසැප පිණිස නොවේ.'' යනුවෙන් ගැමුණු රජ කීය.

(iii) ''අපට අද ම මේ සාකච්ඡාව අවසන් කරන්නට සිදුවෙනවා'' යි නායකතුමා ප්‍රකාශ කළේ ය.

(ලකුණු 1 x 3 = 03)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එසේ වුව ද බ්‍රාහ්මී **ලිපිය** ඉන්දියානුවන් **ස්වාධීන** ව නිපදවා ගත්තක් ද, නැතහොත් පොදු වෙළෙඳුන්ගේ මාර්ගයෙන් විදේශයකින් ලබා ගත්තක් ද යන්න පිළිබඳ ව පුරාලේඛනඥයන් අතරෙහි මත **භේදයක්** තිබේ. මෙයින් යුරෝපීය විද්වතුන් වැඩිදෙනාගේ මතය නම් වෙළෙඳුන් ගෙන ආ ෆිනීෂියානු ලිපිය හෝ **ඇරමයික** වැනි **සෙමිටික** ගණයේ වෙනත් ලිපියක් ඇසුරෙන් එහි ප්‍රභවය සිදු වූ බවයි. **ඩිරින්ජර්** එය උතුරු සෙමිටික ලිපියකින් බිඳුණු බව කියන අතර වීබර්, **බියුලර්** ආදීහු උතුරු සෙමිටික ලිපියක් වූ ෆිනීෂියානු ලිපියෙන් බිඳුණු බව කියති.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.

(ii) ඇසුරෙන්, සෙමිටික, වෙළෙඳුන්, යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියන්න.

(iii) මෙම ඡේදයෙහි ඇතුළත් අතීත කෘදන්ත පදයක්, විකල්පාර්ථයේ නිපාතයක් හා ඊට සම්බන්ධ / අයත් යන අර්ථයේ තද්ධිත පදයක් උපුටා දක්වන්න.

(iv) ඡේදයේ ඇතුළත් අඝෝෂ අල්පප්‍රාණ අක්ෂරයක් හා ඝෝෂ මහාප්‍රාණ අක්ෂරයක් පිළිවෙළින් යෙදුණු වචනයක් උපුටා දක්වන්න.

(ලකුණු 3 × 5 = 15)

(08) පහත දැක්වෙන මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) ඌෂ්මාක්ෂර

(2) පූර්ව ස්වර ලෝප සන්ධිය

(3) කර්තෘ විභක්ති සමාස

(4) ප්‍රථමා විභක්තිය

(5) විධික්‍රියා

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(01) (අ) (i) තම පුතුගේ රෝගයට ප්‍රතිකාර කිරීමට වෛද්‍යවරයෙකු කැඳවා ප්‍රතිකාර කරන්න.
(ii) රෝගය උත්සන්නව පැවතීම නිසා.
(iii) ''මඟ වියදම් ද දිය යුතු ය''
(iv) කාලයක් / වේලාවක්

(ආ) (i) කෙම් කිරීම්, පහන් තැබීම ආදී පූජා විධි
(ii) ගොයම නිල්පාට (සාරවත්) වන අවස්ථාවෙහි.
(iii) උතුම් වූ නැකතකින් වැඩ අරඹා පළමු සී සෑම
(iv) කුඹුරට පළමුව වතුර හරවා / පළමුව කුඹුරෙහි දිය බැඳ

(ඉ) (i) කහපාටැති වස්ත්‍ර හැඳගෙන පොරවාගෙන ආ යුතු බව.
(ii) සුද්ධෝදන රජු
(iii) උතුම් වූ පාදයෙහි බත්කෙණ්ඩා කෙළවර දැඩිව අල්ලාගෙන
(iv) ශරීරයෙහි වර්ණවත් බව හෝ සුගන්ධවත් බව සඳහා ආලේප කරන සුවඳ විලවුන්.

(ඊ) (i) උසස් කුල පුතුන්ට හැර වෙනත් අයට අකමැති බව.
(ii)
- උසස් කුල උපතක් ලැබීම. / වංශවත් බව
- මව්පිය දෙපසින් පවිත්‍ර බව (නින්දාවට පත් නොවීම)
- ස්ත්‍රීන් සමඟ සංවාසයේ නොයෙදීම (මෙම කරුණු වලින් දෙකක් තිබීම ප්‍රමාණවත්ය.)

(iii) ''දෙපිරිසෙන්ම (දෙපැත්තෙන්ම) නින්දාවට පත් නොවී''
(iv) කළ දාසයක් (දාසය කළයක්)

(උ) (i) කනට අමා බිඳු වක්කරන්නා සේය.
(ii) තූර්ය රාවයෙන් / තූර්ය නාදයෙන්
(iii) ''විශේෂ වූ ගීත, නැටුම් කරවමින්
(iv) ඉවත්කොට / බැහැර කොට / නැතිකර

(ඌ) (i) ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාවලියේ එන මට්ටකුණ්ඩලී වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. අදින්න පුබ්බක බමුණා පුතු දැවූ සොහොන් බිමෙහි හඬමින් උන් අවස්ථාවේ, ඒ බව දකින මට්ටකුණ්ඩලී දෙව්පුත් විසින් දෙව්ලොව දී සිතන ලද්දකි.
(ii) මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද පූජාවලියෙන් උපුටා ගත් පාඨයකි. මහලු බවට පත් වූ පසු මහණ වීමට යමු යැ'යි භද්දිය රජු යෝජනා කළ විට අනුරුද්ධ කුමරු විසින් භද්දිය රජුට පවසන ලද්දකි.
(iii) පන්සිය පනස් ජාතක පොතෙහි එන චන්ද කින්නර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. තමන්ට බිරිඳ වන ලෙස බරණැස් රජු ඉල්ලා සිටි විට කිඳුරංගනාව ප්‍රතික්ෂේප කරන අවස්ථාවේ දී ඊට කිපෙන රජු විසින් කිඳුරිය අමතා ප්‍රකාශ කරන ලද්දකි.
(iv) ද්විතීය ධර්ම කීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. රජකුමරුවන් මිනිසුන් යවා ස්වර්ණතිලකා මරණයට පත්වීම නිසා ශෝකයට පත් වන උද්දාල බමුණා ප්‍රලාප කියන අවස්ථාවේ ඔහු විසින් තමාට ම පවසනු ලබන්නකි.
(v) ජී. බී. සේනානායක විසින් ලියන ලද වෙසක් පහන කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. අයියා වෙද ගෙදර ගොස් පිළිස්සුම් තුවාලවලට බෙහෙත් දමාගෙන නිවසට පැමිණීමෙන් පසු ඔහු සිටි කාමරයට කථකයා (මල්ලී) පිවිසි අවස්ථාවේ අම්මා විසින් කථකයා (මල්ලී) අමතා පවසන ලද්දකි.
(vi) ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත ඒ. පී. ගුණරත්න විසින් පරිවර්තිත බැද්දේගම නවකතාවෙන් උපුටා ගත් පාඨයක. කර්ලිනාහාමි දිය ගෙන ඒමට වැවට ගිය අවස්ථාවේ දී නැන්චෝහාමි විසින් කර්ලිනාහාමි අමතා පවසන ලද්දකි.
(vii) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත ''පෙමතෝ ජායතී සොකෝ'' නාට්‍යයේ එන ප්‍රකාශයකි. ස්වර්ණතිලකාව ප්‍රථමවරට දැකීමෙන් කැළඹීමට පත්වන උද්දාල බමුණා සිසුන් වෙන පැමිණි අවස්ථාවේ දී දප්පුල විසින් උද්දාල බමුණා අමතා පවසන ලද්දකි.

සැ.යු
- කතුවරයා, කෘතිය, කථා වස්තුව/ කථාව සඳහා ලකුණු 01 යි.
- කා විසින් කා හට කියන ලදද - ලකුණු 01 යි
- අවස්ථාවට ලකුණු 01 යි

(එ) මෙහි දී පද්‍ය පන්තියේ වස්තු විෂයය හා බස් වහර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් රසාස්වාදය කළ යුතු ය. ගුණාත්මක භාවයෙන් යුතු පිළිතුරකට සුදුසු ලකුණු පිරිනමන්න.

සැ.යු
- 2 ප්‍රශ්නයේ සිට 8 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුරු ඉදිරිපත් කර ඇති පිළිතුරුවල යෝග්‍යතාවය පිරික්සා උචිත පරිදි ලකුණු පිරිනමන්න.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (1) 2 | (2) 5 | (3) 3 | (4) 2 | (5) 3 | (6) 1 | (7) 4 |
| (8) 5 | (9) 2 | (10) 3 | (11) 2 | (12) 5 | (13) 1 | (14) 1 |
| (15) 2 | (16) 4 | (17) 3 | (18) 5 | (19) 1 | (20) 2 | |

II කොටස

(02) (i) අස්වාභාවික නොවන සේ රචිත විධිමත් ළමා සාහිත්‍ය කෘති

(ii) ජාතක කතා, ජන ගී, ජනකාව්‍ය

(iii) ස්වභාව ධර්මයේ විවිධාංග, විද්‍යාංශ, ඓතිහාසික වෘත්තාන්ත තත්කාලීන සිදුවීම්

(iv) ස්වභාව විද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ මුල් දැනුමක් ලබා දෙමින් රචිත පොත් කෙරෙහිය.

(v) ළමා ව්‍යවහාරානුසාරී වුවද මානසික පරිසරයට අනුකූල වූ භාෂා ස්වරූපයෙන් යුක්ත විය යුතුය.

(vi) දෙකයි.

- එක් වර්ගයක් සෞන්දර්යාවබෝධය හා වින්දනය ලබා දීමේ කරණිය ආකල්ප තහවුරු කරයි.
- ළමයා අවට ලෝකයේ පවතින විවිධ ධර්මතා පිළිබඳ අවබෝධය ලබා දීම.

(දෙක යන පිළිතුරට ලකුණු 01 යි. අදාළ එක් කරුණකට ලකුණු 01 වශයෙන් ලකුණු 02 කි)

(2 × 6 = 12)

(03)
- වර්තමාන කෙටිකතාව පැරණි කෙටිකතාවල විකාශනයක් බව මාර්ටින් වික්‍රමසිංහයින්ගේ අදහසයි.
- වස්තු විෂය යථාර්ථරීතිය යන අංශවලින් ජාතක කතා හා කෙටිකතා අතර සම්බන්ධතාවක් තිබුණු නමුත් වස්තු විකාශනය අතින් වෙනස් ය.
- මේ හැරුණ විට චරිත කථා, ඉතිහාස කථා, දේවකථා, මහදැනමුත්තා ආදී ජනකතා, හා කවි කොළ ඇතුළත් ගද්‍ය පද්‍ය සාහිත්‍යාංග පවති.
- නවකථා , කෙටිකථා, යන ඒවාට ම සීමා වූ විශේෂ ලක්ෂණ සහිත සාහිත්‍යාංග සිංහලයාට හුරු වූයේ ඉංග්‍රීසි ආධිපත්‍යයෙන් පසු බටහිර පොත් කියවීමෙන් ද ලද ආභාසයෙනි.
- කෙටිකතාවේ දියුණුවට පුවත්පත් සඟරා ඉවහල් විය.

| | | |
|---|---|---|
| සාරාංශය නියමිත වචන ප්‍රමාණය | ලකුණු | 02 |
| භාෂා නිරවද්‍යතාව | ලකුණු | 03 |
| අන්තර්ගතයට | ලකුණු | 08 |
| | | 13 |

(04) (අ) (i) ඔවුහු බොහෝ දෙනෙක් එම රැස්වීමට සහභාගීවූවෝ වෙති.

(ii) රටේ උන්නතිය උදෙසා කාන්තාවන් පෙරට ආ යුතු ය.

(iii) නිවැරදි වැකියකි.

(iv) නිවැරදි වැකියකි.

(v) ඔහු ද මම නුඹ ද විදේශ රැකියාවකට පිටත්වෙමු.

(ආ) (i) ගුරුවරුන් විසින් පාසලේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස මම තෝරා ගැනුණෙමි. / ගන්නා ලදිමි. / ගනු ලදිමි. / ගනු ලැබීමි. / ගනු ලැබුවෙමි.

(ii) ගොවියන් විසින් මීහරකුන් ලවා කුඹුරු සෑවෙයි / සාවනු ලබයි / ලැබෙයි

(iii) රජය විසින් රුසියාවේ ශ්‍රී ලංකා තානාපති ලෙස කාන්තාවක් පත් කෙරුණා ය. / කරනු ලැබුවාය. / කරන ලද්දීය.

(iv) පොලීසිය විසින් නිළියක් හා නළුවෙක් අත්අඩංගුවට ගැනෙති / ගනු ලබති / ලැබෙති

(v) පුරාවිද්‍යාඥයන් විසින් වටිනා පුරා වස්තුහූ රැසක් සොයා ගනු ලැබූහ. / ගන්නා ලදහ. /ගැනුණහ / ගනු ලැබුවෝය/ ගැනුණු.

(ඉ) (i) අයෙක් - යයි

(ii) මිනිසුන් - දෙනෙක්

(iii) මා - වෙති'යි

(iv) කම්මැලියකු - කළේය

(v) අපි - යුත්තෙමු / අප - යුතුය

(2 × 6 = 12)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

05. (i) ලෝකවාසී - සමාස - විභක්ති සමාස / ආධාර විභක්ති සමාස
බෞද්ධයෝ - විභක්ති - ප්‍රථමා විභක්ති / පෙර විබත / උක්ත විභක්තිය
සම්බුද්ධත්ව - තද්ධිත - භාවාර්ථයේ තද්ධිත / බව යන අර්ථය

(ii) ගැලීම් - කෘදන්ත - භාවාර්ථ කෘදන්ත / භාව කාරක කෘදන්ත
නිසා - නිපාත - හේත්වර්ථ නිපාත
පත්වූවන්ට - විභක්ති - සම්ප්‍රදාන විභක්ති

(iii) සුරඟනන් - සන්ධි - පර ස්වර ලෝප සන්ධිය / පෙර සර ලොප් සඳ
දුටු - කෘදන්ත - අතීත කෘදන්ත
බලා - ක්‍රියා - පූර්ව ක්‍රියා / පෙර කිරිය

(iv) ප්‍රබල - උපසර්ග - උත්කෘෂ්ටාර්ථය / වඩා යන අර්ථය / අර්ථය වැඩි කිරීම.
ඉන්දියානුවෝ- තද්ධිත - ඊට අයත් යන අර්ථය / ඊට සම්බන්ධ
පරාජයට - උපසර්ග - විරුද්ධාර්ථයේ / විරෝධාර්ථයේ

(v) ආගමික - තද්ධිත - එයට සම්බන්ධ / අයත් යන අර්ථය
උවසුඋවැසියෝ - සමාස - ද්වා කාරාර්ථ සමාස / ද අරුත් සමස්
භාවනානුයෝගී - සන්ධි - සමාන ස්වර දීර්ඝ සන්ධි / සවර්ණ ස්වර දීර්ඝය

(06) (අ) (i) ද්විතීය (ii) සඟ (iii) මළුව (iv) දෙවන (v) මාලකය
(vi) සංඝ (ලකුණු ½ × 6 = 03)

(ආ) (i) දෑත (ii) රසාස්වාදය (iii) පත්තිරු (iv) අඳුරති
(v) උපනුපන් (vi) සුරත (ලකුණු ½ × 6 = 03)

(ඉ) (i) වියත්හු - ප්‍රථමා විභක්තිය / පෙර විබත
දූපුතුන්ට - සම්ප්‍රදාන විභක්තිය / සපදන් විබත
(ii) පින්වතුනි - ආලපන විභක්ති / අලප් විබත
පඩිපෙළින් - අවධි විභක්ති / අවදි විබත
(iii) යහළුවන් - කර්තෘ විභක්ති / කතු විබත
පයින් - කරණ විභක්තිය / කරණ විබත (ලකුණු ½ × 6 = 03)

(ඊ) තරගය ජයගත් ක්‍රීඩකයෝ ''අපි දිනුවා'' යි පවසමින්, ජය පැන් බොති; අත්පොළසන් දෙති; ඔල්වරසන් හඬ නගති. සැබවින් ම එය ආස්වාදජනක අත්දැකීමක් නොවේ ද? (ලකුණු ½ × 6 = 03)

(උ) (i) විදුහල්පතිතුමා දරුවන් අමතා අලුත් මල් පොකුරු රැගෙන එන ලෙස පැවසී ය.
(ii) තමාගේ ඒ උත්සාහය (ව්‍යායාමය) හුදෙක් රජසැප පිණිස නොවන බව ගැමුණු රජු කීය.
(iii) තමන්ට එදින ම ඒ සාකච්ඡාව අවසන් කිරීමට සිදුවන බව නායකතුමා ප්‍රකාශ කළේ ය.
(ලකුණු 1 × 3 = 03)

(07) (i) ඇරමයික, ඩිරින්ජර්, බියුලර්, භේදයක්, ලිපිය, සෙමිටික, ස්වාධීන

(ii) ඇසුරෙන් - කෙටි පාපිල්ල / කෙටි කොන් පාපිල්ල, කොම්බුව
සෙමිටික - කොම්බුව, කෙටි ඉස්පිල්ල, කෙටි ඉස්පිල්ල
වෙළෙඳුන් - කොම්බුව, කොම්බුව, කෙටි පාපිල්ල / කෙටි කොන් පාපිල්ල
(ප්‍රකෘති ව්‍යංජනය නොසලකා ලකුණු දෙන්න.)

(iii) අතීත කෘදන්ත - බිඳුණු, වූ
විකල්පාර්ථ නිපාත - නැතහොත්, හෝ
ඊට සම්බන්ධ / අයත් තද්ධිත - ඉන්දියානුවන්, යුරෝපීය, ෆිනීෂියානු

(iv) ඉන්දියානුවන්, විද්වතුන්, පුරාලේඛනඥයන්, වෙළෙඳුන්

(v) ප්‍රභවය
(වෙනත් නිවැරදි පිළිතුරු සලකන්න.) (ලකුණු 3 × 5 = 15)

(08) (i) <u>ඌෂ්මාක්ෂර</u>

අක්ෂර උච්චාරණය කිරීමේ දී මුඛයෙන් උණුසුම් වාතය නිකුත්වන නිසා ''ඌෂ්මන්'' යන නාමයෙන් හඳුන්වා ඇත.

ශ ෂ ස හ (අ)ඃ , ෆ

විසර්ගය (අ)ඃ උෂ්මාක්ෂරයක් ලෙස ද වියත් ඇදුරෝ සලකති.

(ii) <u>පූර්ව ස්වර ලෝප සන්ධිය</u>

පෙර පදයේ අග ඇති ස්වරය ලෝප්කර අනතුරුව පසුපදයේ මුල් ස්වරය සමඟ ගලපා ගන්නා සන්ධිය වේ. සිදත් සඟරා කතුවරයා දක්වා ඇත්තේ ''පෙර සර ලොපා පර සර ගතට පැමිණ වූ බැවින් පෙර සර ලොප් සඳ නම්'' ලෙස ය.

| | | |
|---|---|---|
| උදා - | දින + ඉසුරු | යන + එන |
| | දි (න් + අ) + ඉසුරු | ය (න් + අ) + එ න |
| | දි (න්) + ඉසුරු | ය (න්) + එ න |
| | නි | නෙ |
| | දිනසුරු | යනෙන |

(iii) <u>කර්තෘ විභක්ති සමාසය</u>

සමාස වන පද දෙකෙන් මුල් පදය කර්තෘ විභක්ති අර්ථය ගනී. සිඳත් සඟරා කතුවරයාට අනුව

උදා - පරා විසින් පුටුයේ - පරපුටු (කොවුලා, යාචකයා)

බඹහු විසින් දෙනලද්දේ - බඹදත් (සිවුර)

දෙවියන් විසින් දෙන ලද්දේ - දෙව්දත් (බොජුන්)

වේයන් විසින් නගන ලද පස් - වේපස්

(iv) <u>ප්‍රථමා විභක්ති</u>

- ★ කර්තෘ කාරක වාක්‍යයේ උක්ත කර්තෘ ප්‍රථමා විභක්තිය ගනියි.

  උදා - වැද්දා මුවන් මරයි.

  අම්මා බත් උයන්නීය.

- ★ කර්මකාරක වාක්‍යයේ උක්ත කර්මය ප්‍රථමා විභක්තිය ගනියි.

  උදා - වැද්දන් විසින් මුවෝ මැරෙති. / මරනු ලබති.

  උපාසිකාව විසින් පහන දල්වනු ලබයි

- ★ වැද්දා, අම්මා ★ මුවෝ, පහන

(v) <u>විධික්‍රියා</u>

ආදරයෙන් හෝ අනාදරයෙන් කෙරෙන ඉල්ලීමක් සේ විධානයක් හැඟවීම සඳහා යොදා ගන්නා ක්‍රියා - විධික්‍රියා නම් වේ. ලේඛන ව්‍යවහාරයෙහි මෙන් ම කථා ව්‍යවහාරයෙහි ද මේවා සකස් කර ගැනීම සඳහා භාවිතවන ප්‍රත්‍යය ගණනාවක් ඇත.

| | | |
|---|---|---|
| ව | - | කියව |
| ව, වූ | - | නමව - කියවු |
| නු | - | නවතිනු |
| න්න | - | වන්න |
| මැන | - | අසනුමැන |
| පිය | - | බලපිය |
| පන් | - | හිටපන් |
| පල්ලා | - | හිටපල්ලා |

(ලකුණු 5× 3 = 15)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources